**24.** **ශීර්ෂය 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය**

**24.1** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාර බැරකම් පිළිබඳ ලේඛනය පවත්වා නොතිබුණි.

**24.2** **විසර්ජන ගිණුම**

**24.2.1** **අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු. 530,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 02 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 23 ක් හා සියයට 27 ක් වී තිබුණි.

**24.3** **යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**24.3.1** **අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**24.3.2** **විගණන හා කළමනාකරණ කමිටුව**

විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**24.4** **කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථාවක් පහත දැක්වේ.
2013 වර්ෂයේදී කටයුතු කිරීමට නොහැකි වූ පැමිණිලි 527 ක් හා 2014 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 1,087 ක් සමග මුළු පැමිණිලි සංඛ්‍යාව 1,614 ක් වී තිබුණි. .එම පැමිණිලිවලින් 706 ක් විවිධ හේතු මත පරීක්ෂාවට භාජනය කිරීමට නොහැකි වී තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට පැමිණිලි 487 ක කටයුතු නිම කර තිබූ අතර පැමිණිලි 421 ක කටයුතු කළ යුතුව තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේදී කටයුතු කළ යුතුව තිබුණු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 54 ක පමණ ප්‍රමාණයක කටයුතු නිම කර නොතිබුණි.

**24.5** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ---------------- | ---------------- | ------------- | ----------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 18 | 12 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 08 | 02 | 06 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | | ---- | ----- | ----- |
| | **එකතුව** | **30** | **17** | **13** |
| | | == | == | === |